# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 1842/22 - 2013 දෙසැම්බර් මස 28 වැනි සෙනසුරාදා - 2013.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

රාවුෆ් මොහොමඩ් හිල්මි නම් වූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කොත්මලේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි හෙට්ටියාකන්දගේ අරුණපුෂ්ප සෞම්‍යසිරි ප්‍රනාන්දු වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ මහතා කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

හෙ. අ. සෞ. ප්‍රනාන්දු,
තේරීම්භාර නිලධාරි,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2013 දෙසැම්බර් මස 19 වන දින,
මැතිවරණ කාර්යාලය,
නුවරඑළිය.

01 - 379

1A - G 18779— 180 (2013/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ කින්නියා ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතු කොට ගෙන කින්නියා ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මොහමඩ් අලි මොහමඩ් සිරාජ් නම් වූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කින්නියා ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන කාසුදීන් මුනව්වර් කාන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කින්නියා ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි නාලක රත්නායක වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කාසුදීන් මුනව්වර් කාන් මහතා කින්නියා ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

නාලක රත්නායක,
තේරීම්භාර නිලධාරි,
කින්නියා ප්‍රාදේශීය සභාව.

2013 දෙසැම්බර් මස 23 වන දින,
මැතිවරණ කාර්යාලය,
ත්‍රිකුණාමලය.

01 - 380